


41 පිටෙන්

වල්මත්වූවෝ රංගනයේ දී වරක් ඔහු හා ගැටුණු ශ්‍රේෂ්ඨ රංගන ශිල්පී ටෝනි රණසිංහ මා හා පැවසුවේ, "සිංහල සිනමාවේ භරත මුණි, වසන්ත ඔබේසේකර ඒ වුනාට හරියට ටිවෙන්ටි ලෙන්ස් එක අඳුරන්නේ නැ□ යනුවෙනි.

ඇසු පිරූ තැන් ඇති බුද්ධි මතෙකු වූ ටෝනි

අපහාසයටත් අපේ සර් හැඳින්වුයේ සිංහල සිනමාවේ භරතමුණි ලෙසින් වීම වැදගත් යන්න මගේ හැඟීමයි. ජීවිතය පිළිබඳව මෙන්ම, දේශපාලනය, සිනමාව, ගෘහ ජීවිතය, ආදරය පිළිබඳ ආවේනික අවුල් විනයකින් කටයුතු කරමින් දිවි ගතකල වසන්ත ඔබේසේකර දුර්ලභ වර්ගයේ බුද්ධිමතෙකි.

භීෂණ සමයේ තම ජීවිතයට එල්ලවිය හැකි තර්ජන නොතකා නිවසේ රැකවරණ ලබා දී සිටි තරුණ පිරිස හද සැත්කමට සර් පිටරට ගිය අතරේ ගෙදර තිබූ දුර්ලභ පොත පත ඇතුළු වටිනා සියල්ල විකුණා පලා ගිය මොහොතේ සර් කඳුළු සලමින් පාපතර ද්‍රෝහීන් සිදු කළ ඒ සිද්ධිය විස්තර කළ අන්දම අමතක නොවන්නකි.

දින කිහිපයකට පෙර සර් බලන්නට ගිය ප්‍රසන්න විතානගේ සමග පෙළෙමින් ඇති වේදනාව ගැන කියමින්



ණීමරණං නියතං ..... මට දැන් යන්න දීපල්ලා□ යැයි පැවසූ සර් අද නික්ම ගියේය.

සර් යන ගමන් අපේ මවං ද රැගෙන ගියේය.

ප්‍රියත් ලියනගේ

